Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com    www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015 Residence – 045 2232985

කාර්යාලය / Office – නවනගරය, රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number

ඔබේ අංකය / உமது இல / Your Number

දිනය / திகதி / Date – 2023.02.22

සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ**
**සබර/2023/01**

## බාහිර පාර්ශවයන් වෙතින් පාසල් වෙත ලැබෙන ආධාර, පරිත්‍යාග හා වෙනත් ලැබීම්

පාසල් තුල අධ්‍යාපනික කටයුතු හා ඊට අදාල බාහිර ක්‍රියාකාරකම් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය.පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතුය.

02. නමුත් සමහර පාසල්වල බාහිර පාර්ශවයන් විසින් විවිධ වැඩ සටහන් පසුගිය කාලය තුළ ක්‍රියාත්මක කර විවිධ ගැටළු වලට මුහුණ දීමට සිදුවී ඇත. බොහෝ වැඩ සටහන් වල අරමුණ පාසල් වලට හෝ සිසුන්ගේ සුභ සාධන කටයුතු කිරීම නොව පටු දේශපාලන හෝ වෙනත් අරමුණු බව පෙනී ගොස් ඇත.

03. විවිධ ස්වේච්ඡා සංවිධාන ,පෞද්ගලික ආයතන, විදේශීය ආයතන සහ පෞද්ගලික පරිත්‍යාගශීලීන් විසින් පාසල් උපකරණ බෙදාදීම් වැනි විවිධ ආධාර, පරිත්‍යාග සම්මන්ත්‍රණ, පුහුණු වැඩ සටහන් සහ වෙනත් ලැබීම් සිසු දරුවන් වෙත ලබාදීමේ විවිධ වැඩසටහන් සිදු කිරීමට ඉදිරිපත් වන ඉල්ලීම් දිනෙන් දින ඉහළ යමින් පවතින බවද පෙනී ගොස් ඇත.

04. එබැවින් ඉදිරියේදී එවැනි වැඩ සටහන් වලට ඉල්ලීම් ලැබුනහොත් ඒ සම්බන්ධව වහාම එහි යෝග්‍යතාවය හා අවශ්‍යතාවය සලකා බලා මටද පිටපතක් සහිතව ඔබගේ අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. ඔබගේ අනුමැතියක් නොමැතිව කිසිදු බාහිර වැඩ සටහනක් පාසල් තුල ක්‍රියාත්මක නොකල යුතු බව මින් ඔබට දන්වා සිටින අතර දේශපාලන හෝ වෙනත් එවැනි අරමුණු උදෙසා දේශන නොපැවැත්වීමට වගබලා ගතයුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර

සුජානි ආර්.විජේතුංග.
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමු පළාත් සභාව.